# අපි හොඳ යාළුවෝ



ශෙලි ශේෂණා සංජු රන්තිලක

2 - E

# “අපි හොඳ යාළුවෝ ”

ISBN 978-624-206-829-9

**කතා ප්‍රකාශනයකි**

පළමුවන මුද්‍රණය 2023 ඔක්තෝබර්

**කතාව සහ චිත්‍ර**

ශෛලි ශේෂණා සංජු රත්තිලක

2 ශ්‍රේණිය E

මහනුවර / මහාමායා බාලිකා විද්‍යාලය

## පිදුම

මාව නිතරම දිරිමත් කළ

මාගේ පන්තිභාර ගුරුතුමියට

සහ

මාගේ ආදරණීය දෙමව්පියන්ට

මෙම පොත

ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තයික් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

# අපි හොඳ යාළුවෝ

මගේ නම සඳලි. මම පාසල් නිවාඩුවට ගමේ ගියා. මගේ පරණ යාළුවෝ මට ගමේ එද්දි හම්බවුණා. එයාලව දැකලා මටත් සතුටුයි. මට වගේම මගේ යාළුවොන්ටත් හරිම සතුටුයි. එයාලා මං ඉන්න පළාත ගැන එහෙම තොරතුරු අහලා දැනගත්තා. කාලය නොදැනීම ගෙවිලා ගියා.



අපි හැමෝම හුඟක් සතුටින් කාලය ගත කළා. ගී ගැයුවා, නැටුවා, සෙල්ලම් කළා. ඒ වගේම අපි පාඩම් කරා. තවත් අපි හැංගි මුත්තෝ සෙල්ලම් කළා.

අපි හුඟක් සමගියෙන් කාලය ගත කළා. දවස ගෙවිලා ගියා. තවත් දවසකුත් උදාවන තුරු ඉවසිලි නොමැතිව අපි නින්දට වැටුණා.



ඔන්න තවත් දවසක් උදාවුණා. උදේවුණ ගමන්ම අපි හැමෝම සෙල්ලම් කරන්න එකතු වුණා. අපි අද සෙල්ලමට දුවමු කියලා යාළුවෙක් කිව්වා. අපි සෙල්ලමට දුවද්දී යාළුවෙක් වැටුණා. එයාගේ අත තුවාල වෙලා හොඳටෝම අඩනවා.



මම ඉක්මනට දුවලා ගිහින් යාළුවාගේ අම්මාට කිව්වා. යාළුවාගේ අම්මා ඇවිත් එයාව එක්කරගෙන ගෙදරට ගියා. යාළුවා හොඳටෝම ඇඬුවා.



අපි හැමෝම හරිම දුකින් එයාට සමුදුන්නා.



මම ගෙදර ගිහින් වුණ දේ අම්මාට කිව්වා. අම්මා කිව්වා ආයේ කවදාවත් දුවන්න පනින්න යන්න එපා කියලා. ඒ කතාව අහපු මට හොඳටෝම දුක හිතුනා.



පහුවදා අපේ යාළුවෝ ටික එකතු වෙලා වැටුණු යාළුවාව බලන්න එයාගේ ගෙදර ගියා. එයා අපිව දැකලා සතුටු වුණා.



යාළුවාගේ අම්මා කිව්වා පරිස්සමින් ගිහින් සෙල්ලම් කරලා එන්න කියලා. යාළුවාටත් හරිම සතුටුයි. අනිත් යාළුවෝ එයාගේ අත අල්ලාගෙන පිට්ටනියට එක්කරගෙන ගියා.



අපි හරිම පරිස්සමින් සෙල්ලම් කළා.



මට ආයෙමත් ගෙදර යන්න වෙනවා කියලා අම්මා කිව්වා. ඉස්කෝලේ නිවාඩුවත් ඉවර හින්දා මං අම්මා කිව්ව දේ ගිහින් යාළුවොන්ට කිව්වා. යාළුවෝ කිව්වා අපිත් එක්ක සෙල්ලම් කරන්න ආයෙමත් ගමේ එන්න කියලා. අපි සතුටින් සමුගත්තා. මට හරිම දුකයි. යාළුවොන්ටත් එහෙමයි.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක  වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.11.01

ISBN 978-624-206-829-9